

CJ

# 8
# විවිධ කාච වර්ග

## දුරරූප කාච

යම් නියමිත කැමරාවක් සම්බන්ධයෙන් එහි සාමාන්‍ය කාචයට වඩා වැඩි නාභීය දුරක් ඇති කාච දුරරූප කාච ලෙස හැඳින්වේ. ඒ ඒ කැමරාවන්ගෙන් ලැබෙන රූප රාමුවේ ප්‍රමාණය අනුව සාමාන්‍ය කාචය නම් කර ඇති අතර මි.මී. 35 SLR කැමරාවේ කාචය මි.මී. 50 කි. මධ්‍යම ප්‍රමාණයේ කැමරාවන්හි මි.මී. 75 (හැසල්බ්ලඩ්) සහ මි.මී. 90 (මමියා R.Z. 67) ලෙස වේ.

ඇසෙන් අත්විඳීමට නොහැකි දෘශ්‍යමය ලෝකයක් විවිධ කාචයන්ගෙන් අත්විඳිය හැකිය. ඇසට නොපෙනෙන තරම් ඈත ඇති වස්තූන් ද, ඇසට පෙනෙන මානයේ වුවද විස්තර නොදක්වෙන වස්තූන් ද දුරරූප කාචයන්ගෙන් විස්තරාත්මකව බලාගත හැකිය. දුරරූප කාචයකට උරුම වූ අනෙකුත් දෘශ්‍යමාන ලක්ෂණයන් හා සංයෝග වී අපට දකගත හැකිවන රූපය චමත්කාරය. ඡායාරූපයටම විශේෂිතය. දුරරූප කාචයක් භාවිතයෙන් ඡායාරූපයක් ගන්නා විට වස්තූන් නව ආකාරයකට රාමුව තුළ සංවිධානය කරගත හැකිය. ඡායාරූපයක් තුළ ප්‍රධාන වස්තුව සැකැස්මක් සහිතව රාමුගත